<u>භාව ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණය</u>

<u>"භය" නමැති ස්ථායි භාවය හා සබැඳි අවස්ථා නිරූපණය කරමු.</u>

රසයක් උපදින්නේ භාවයක් මුල් කොට ගනිමිනි. පුද්ගලයෙකුගේ සිතෙහි පවතින හැඟීම් සමුදාය ස්ථායි භාව නමින් හැඳින්වෙන බවත් භාරත මුණි පඬිවරයා පෙන්වා දී ඇත. ඒ අනුව භව නැමති ස්ථායි භාවයෙන් ප්‍රදර්ශනය වන්නේ "භයානක රසයයි"

- භාවය සඳහා මූලික වන ශරීර කොටස් -:
    1. ඇස් විශාල වීම හා ඇස් බෝලය දෙපසට ගමන් කිරීම
    2. අත් පා දරදඬු වීම
    3. මුව විවර වීම
    4. උරහිස් - බෙල්ල හැකිළීම
- භය ස්ථායි භාවය මතුවන අවස්ථා
    - භයානක සත්ත්වයකු දැකීම
    - විශාල ශබ්දයක්
    - මිනිස්/සත්ත්ව ගැටුමක්
    - කරදරයකට පත්වීම (දියේ ගිලීම/රිය අනතුරක්/හිරිහැරයක්)

ක්‍රියාකාරකම -: "භය" නමැති ස්ථායිභාවය හා සබැඳි අවස්ථා නිරූපණය කරමු.

පැවරුම

1. රස හා භාවයන් පිළිබඳ හඳුන්වා දුන් පඬිවරයාගේ නම ලියන්න
2. "භය" නැමැති ස්ථායිභාවෙයන් උපදින රසය නම් කරන්න.
3. "භය" නැමැති ස්ථායිභවය දැක්වෙන පින්තූර රැස්කර කෙටි විස්තරයක් සහිත පොත් පිංචක් සකස් කිරීමට යොමු කරන්න.
4. භය ස්ථායිභාවය මතු වන අවස්ථා පහත දැක්වේ. චරිත ස්වභාවය ස්මතු වන නර්තනයක් නිර්මාණය කරන්න.
    a. භයානක සත්ත්වයෙකු දැකීම
    b. මිනිස්/සත්ත්ව ගැටුමක්
    c. විශාල ශබ්දයක්
    d. කරදරයකට පත්වීම (දියේ ගිලීම, රිය අනතුරකින්, හිරිහැරයක්)